**17. ශීර්ෂ 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

**17.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 57 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**17.2 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

**17.2.1 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**17.2.2 විගණන හා කළමනාකරණ කමිටුව**

දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**17.3 කාර්යසාධනය**

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පහත දැක්වේ.

| රාජකාරියේ ස්වභාවය | **2014 ජනවාරි 01** දිනට කෙටුම්පත් කිරිම අවසන් නොවු ඉල්ලීම් සංඛ්‍යාව | **2014 වර්ෂයේදි** පාර්ශව වෙතින් ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | **2014 දෙසැම්බර් 31** දින වන විට කෙටුම්පත් සකස් කර අදාල පාර්ශව වෙත භාර දුන් සංඛ්‍යාව | **2014 දෙසැම්බර් 31** දිනට කෙටුම්පත් කිරිම අවසන් නොවු ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අණ පනත් කෙටුම්පත් කිරිම(මුලික හා සංශෝධන නිති) | 19 | 39 | 28 | 30 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පනත් | 06 | 22 | 15 | 13 |
| රෙගුලාසි සංශෝධනය කිරිම(උපකාරක නිති) | 46 | 88 | 94 | 40 |
| එකතුව | **71** | **149** | **137** | **83** |

2014 වර්ෂයේදී පනත් කෙටුම්පත් 137 ක් සකස් කර තිබුණු අතර, එයින් පනත් 47 ක් පමණක් පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබුණි.

**17.4 අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| ේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 | 10 |
| (ii) තෘතියික මට්ටම | 28 | 03 | 25 |
| (iii)ද්විතියික මට්ටම | 62 | 36 | 26 |
| (iv)ප්‍රාථමික මට්ටම | 24 | 20 | 04 |
| එකතුව | **151** | **86** | **65** |